HUSSAIN AHAMED
Attorney-at-Law
34-1/49, Lawyers Office Complex
ST. SEBASTIAN HILL,
COLOMBO - 12.

<u>කොළඹ දිසා අධිකරණයේ දී ය.</u>

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
හිල්ටන් ස්පෝට්ස් කම්ප්ලෙක්ස්
ඇව්ලන් චතුරශ්‍රය
ලෝටස් පාර,
කොළඹ 01.

**පැමිණිලිකරු.**

නඩු අංකය: 15322/MR එදිරිව -

04-8-1994

තිහාල් ශ්‍රී අමරසේකර
කොම්ප්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**විත්තිකරු.**

1994 ක්වූ අගෝස්තු මස 04 වන මෙදින දී ය.

ස්වකීය නීතිඥ හුසේන් අහමඩ් මගින් පෙනී සිටින පූර්වෝක්ත පැමිණිලිකරුගේ පැමිණිල්ලෙන් පහත සඳහන් පරිදි ප්‍රකාශ කෙරේ:-

01. පැමිණිලිකරු වනාහි ශ්‍රී ලංකාවෙහි නිසි පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද සීමාසහිත වගකීමෙන් යුක්ත වූ ද එහි ලේඛනගත කාර්යාලය ඉහත සඳහන් ලිපිනයෙහි පිහිටා ඇත්තා වූ ද පොදු මහජන සමාගමකි.

02. විත්තිකරු පදිංචි වී සිටින්නේ ද මෙහි මින් මතු දැක්වෙන නඩු නිමිත්ත උද්ගත වූයේ ද මෙම අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බලසීමාව තුළ ය.

03. විත්තිකරු වූ කලී වෘත්තියෙන් වරලත් ගණකාධිකාරිවරයකු වන අතර 1983.0ං.15 දින සිට 1991.01.17 දින දක්වා පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයකු ව සිට ඇත.

04. පැමිණිලිකාර සමාගම සංස්ථාගත කරන ලද්දේ ප්‍රධාන වශයෙන් කොළඹ හිල්ටන් ඉන්ටර්නැෂනල් හෝටලය ඉදිකිරීමට හා අවශ්‍ය දෑ සපයා ක්‍රියාත්මක කරගෙන යාමට ය.

2 පිට..

05. ඉහත කී අරමුණ සඳහා "මිට්සුයි ඇන්ඩ් කම්පනි ලිමිටඩ්" සහ "ටයිසේ කෝපරේෂන්" නමැති සමාගම්වලින් ජපාන යෙන් 12,300,000,000 ක ණයක් වසර 15 ක් ඇතුළත වසරකට 7.95% ක පොලියක් සමඟ ආපසු ගෙවීමට, සත්‍ය පිටපතක් 'ඒ' වශයෙන් ලකුණු කොට මේ සමඟ ගොනු කර මෙහිම කොටසක් වශයෙන් අයැද සිටින 1984.01.21 දින දරන ලිඛිත ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි හා නියමයන්ට යටත්ව පැමිණිලිකාර සමාගම විසින් ලබා ගන්නා ලදි.

06. එකී ණය ගිවිසුමේ 6.01 (ඩ්) ව්‍යවස්ථාව ප්‍රකාර එකී ණය ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලු බදු හෝ පොලිය හා අනෙ‍ය ගෙවීම්වලට අදාලව වගකීමෙන් නිදහස් වීමක් ශ්‍රී ලංකා රජයෙන් පැමිණිලිකාර සමාගම විසින් ලබාගත යුතු වීම පූර්ව කොන්දේසියක් විය.

07. අධ්‍යක්ෂවරයකු හා වරලත් ගණකාධිකාරිවරයකු ද වූ විත්තිකරු ඊට එක්ග වී එපරිදි වූ ගණකාධිකාරිවරු වශයෙන් වෘත්තියමය සේවාවන් සැපයීම ද කරන ලදි. එකී බදු නිදහස ලබා ගැනීමට සහ/හෝ එකී ණය මත පොලිය ප්‍රේෂණය කිරීමේදී රඳවා ගැනීමේ බදු වලින් ස්ථිර නිදහස් කිරීමක් පැමිණිලිකාර සමාගමට ලබාදීමට සහ/හෝ එකී ණය යටතේ අයවිය යුතු පොලි යෙන් පැන නගින පිටරට ප්‍රධානියාගේ අතට ලාභයක් නොයන බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සෑහීමට පත් කිරීමට විත්තිකරු එක්ග වූ බව සහ/හෝ නියෝජනය කළ බව සහ/හෝ වගකීම භාරගත් බවත් පැමිණිලිකාර සමාගම ඒ මත අවංක සිතින් ක්‍රියා කළ බවත් පැමිණිලිකරු අයැද සිටී.

08. මෙකී කරුණු ප්‍රකාර ඉහත 7 වන ඡේදයේ අයැද ඇති කරුණු අපලාපනය කිරීමෙන් පැමිණිලිකරු නිතියෙන් ප්‍රතිබන්ධනය කෙරෙන බව සහ/හෝ තහනම් කෙරෙන බව පැමිණිලිකරු අයැද සිටී.

3 පිට..

09. වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් ගණකාධිකාරිවරයකු ද පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයකු ද වූ විත්තිකරු, සමාගමේ අධ්‍යක්ෂවරයකුවීම හේතුවෙන් පැමිණිලිකාර සමාගම කෙරෙහි ඇති ඔවුන්ගේ විශ්වසනීය බැඳීම් හේතුකොට ගෙන විශේෂිතව පැමිණිලිකාර සමාගමේ උපරිම සුභ සිද්ධිය තකා කටයුතු කිරීමට නීතිමය බැඳීමක් විත්තිකරු කෙරෙහි තිබූ බව පැමිණිලිකරු අයැද සිටී.

10. ඔහුගේ ඉහත කී එකඟවීම සහ/හෝ නියෝජනය කිරීම සහ/හෝ අවබෝධය සහ/හෝ ඔවුන්ගේ බැඳීම් අනුව කටයුතු කරමින් විත්තිකරු විසින් 84.02.28 වන දින දරන ලිපිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ට යැවූ බවත්, ශ්‍රී ලංකා ආදායම් බදු දෙපාර්තමේන්තුවේ 84.03.01 දින දරන ලිපියෙන් ඊට පිළිතුරු සැපයූ බවත් ඒවායේ පිටපත් පිළිවෙලින් 'බී' සහ 'සී' වශයෙන් ලකුණු කොට මේ සමඟ ගොනු කර මෙහි ම කොටස් වශයෙන් අයැද ඇති බවත් පැමිණිලිකරු අයැද සිටී.

11. විත්තිකරු ඉන්පසු ඔහුගේ හීසීපුම සහ/හෝ නියෝජනය කිරීම සහ/හෝ පොරොන්දුව සහ/හෝ බැඳීම් උල්ලංඝනය කරමින් සාවද්‍ය ලෙස සහ/හෝ ද්වේශ සහගත ලෙස ඉහත 'සී' වශයෙන් ලකුණු කර ඇති 84.03.01 දින දරන ලිපිය ප්‍රකාර කිසිදු පියවරක් ගැනීමට සහ/හෝ අවශ්‍ය බදු නිදහස ලබා ගැනීමට අපොහොසත් වූ බව පැමිණිලිකරු අයැද සිටී.

12. සත්‍ය පිටපතක් 'ඩී' වශයෙන් ලකුණු කොට මේ සමඟ ගොනු කර මෙහි ම කොටසක් වශයෙන් අයැද සිටින 94.05.30 දින දරන එකී ලිපියෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පැමිණිලිකාර සමාගම විසින් බදු නිදහසක් ලබා ගෙන නොතිබූ බැවින් එකී ණය මත එකී ජපන් සමාගම්වලට

4 පිට..(

පැමිණිලිකාර සමාගම විසින් ගෙවන ලද පොලිය වන රුපියල් 79,885,836.00 වන මුදලින් සියයට 33 1/3% බැගින් ගෙවන ලෙස නොතිසි කරන බව සහ/හෝ ඉල්ලා සිටි බව පැමිණිලිකරු කියා සිටී.

13. විත්තිකරුගේ ඉහත කී සාවද්‍ය හැසිරීම හේතු කොට ගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රු.26,628,613.00ක මුදලක් ගෙවීමට පැමිණිලිකරු කෙරෙහි නීතියෙන් වගකීමක් සහ/හෝ බැඳීමක් උද්ගත වී ඇති බවත් එම මුදල පැමිණිලිකාර සමාගම වෙත ගෙවීමට විත්තිකරු නීතියෙන් බැඳී සිටින බවත් සහ/හෝ වගකීමක් ඇති බවත් පැමිණිලිකරු අයැද සිටී.

14. ඒ අයුරින් පැමිණිලිකාර සමාගමට රු.26,628,613.00 වන එකී මුදලින් පාඩු හා අලාභ විඳින්නට සිදු වූ බවත්, එය විත්තිකරුගේ බැඳීම් සියල්ල සහ/හෝ එකඟවීම් සහ/හෝ පොරොන්දුවීම් සහ/හෝ නියෝජනය කිරීම් පිළිබඳ විත්තිකරුගේ සාවද්‍ය හැසිරීම් හේතුවෙන් සිදු වූ බවත් එය පැමිණිලිකාර සමාගමේ සුභසෙත ට පටහැනි බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

15. ඉහත අයැද ඇති කරුණු ප්‍රකාර රු.26,628,613.00 ක් වන එකී මුදල ඒ සඳහා පොලියත් සමඟ පැමිණිලිකරු වෙත ගෙවීමට විත්තිකරු බැඳී ඇතත් සහ/හෝ ගෙවන ලෙස ඉල්ලා සිටින ලද මුත් එය ගෙවීමට විත්තිකරු සාවද්‍ය ලෙස අපොහොසත් වී හා නොසලකා හැර ඇති බැවින් එය අයකර ගැනීමට විත්තිකරුට එරෙහිව නඩු පැවරීමට පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපචය වී ඇත.

16. පැමිණිලිකරු මෙම නඩුවේ විෂය වස්තුව රු.26,628,613.00 කට තක්සේරු කරයි.

5 පිට..(

එසේ හෙයින් පැමිණිලිකරු ආයාචනා කරන්නේ:

( අ ) රු.26,628,613.00 ක මුදලක් හා ඒ සඳහා මෙහි සඳහන් දිනයේ සිට තීන්දු ප්‍රකාශ දිනය දක්වා නෛතික පොලිය ද එතැන් සිට මුදල සම්පූර්ණයෙන් ගෙවන තුරු තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදලට පොලිය ද අයකර දෙන ලෙසට විත්තිකරුට එරෙහි නඩු තීන්දුවක් හා තීන්දු ප්‍රකාශයක් කරන ලෙසත්;

( ආ ) නඩු ගාස්තු අයකර දෙන ලෙසත්; සහ

( ඇ ) මෙම අධිකරණයට සුදුසුයයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන සලසා දෙන ලෙසත් ය.

CERTIFIED AS
TRUE COPY

..........................................
පැමිණිලිකරුගේ නීතිඥ.
HUSSAIN AHAMED
Attorney-at-Law
34-1/49, Lawyers Office Complex
ST. SEBASTIAN HILL,
COLOMBO — 12.

සකස් කරන ලද්දේ:

නීතිඥ පද්ම බණ්ඩාර මහතා සහ
ඉන්රාම් මොහොමඩ් මහතා විසිනි.